# Sustainable Entrepreneurship



## නූතන ව්‍යවසායකයා

නූතන ලෝකය තුළ කතා බහට ලක්වන මාතෘකා අතර ආර්ථික සංවර්ධනය ව්‍යවසායකයා ධනිය සංවර්ධනය වැනි මාතෘකා බොහෝ විට අසන්නට ලැබෙන මාතෘකා වුවත් ලෝක සංවර්ධනය තුළ ඉහත වචන වලින් සිදුවන කාර්යය ක්‍රියාවෙන් ඔප්පු කිරීමේ දි ව්‍යවසායකත්වය සහ ධනිය සංවර්ධනය ඉතා වැදගත් ප්‍රවේශයක් ලෙස පෙන්වා දීමට පුළුවන. රටක් සංවර්ධනය වීමේදි ආර්ථික සමාජයිය සංස්කෘතික දේශපාලන යන සියල්ලන්ගේම සංවර්ධනය විය යුතු බව නූතනය වන විට අවබෝධ වී තිබුනත් මුදල් මත තිරණය වන ආර්ථිකයක් තුළ ව්‍යාවසායකයන්ට ධනිය සංවර්ධනයක් කරා රටක් ලෝකයක් ගමන් කරවීමට මං සොයන විට තිබෙන්නා වූ භෞතික සම්පත් මතු පරම්පරාව සදහා ප්‍රයෝජනවත් වන ආකාරයට කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ජනගහණය සීඝ්‍රයෙන් වර්ධනය වන ලෝකයක් තුළ මානව අවශ්‍යතා අධික වන විට වනාන්තර එළි පෙහෙලි වන විට ලෝක සමතුලිතය වෙනස් වෙමින් මිළ මුදල් ඉලක්ක කර ගනිමින් පමණක් සංවර්ධනය වීමේ ඇති ඵලය කුමක්දැයි සිතා බැලිය යුතුය.

ලෝකයම මුදල් මත තිරණය වන යුගයක ධනිය සංවර්ධනය ලෝකය තුල වැඩියෙන් කථා කල යුතු මාතෘකාවක් බවට පත්කරගත යුතුය. එමෙන්ම නව සංවර්ධන මාර්ග තනන ව්‍යවසායකයන්ගේ අවධානය යොමුකල යුතු තවත් එක් පැතිකඩක් ලෙස ධනිය සංවර්ධනය මුල්කරගෙන නව ආර්ථික මානයන් හඳුන්වාදිම තමන් සතු වගකීමක් බව ව්‍යවසායකයන් සැමවිටම සිහිතබා ගත යුතුය. ගහ කොළ සතා සිව්පාවා ආරක්‍ෂා කරගෙන තිරසාර සංවර්ධනයක් කරා ලඟාවිය හැකිනම් එය මුළු මහත් ලෝකයාට මෙන්ම මතු පරම්පරාවටද සිදුකරනු ලබන මහඟු යුතුකමකි.

ලෝකය ගත් විට පරිසරය විනාශ කරමින් ලගාකරගෙන තිබෙන ආර්ථික සංවර්ධනය දෙස බැලු විට ඉතා ඉහල අගයකින් යුතුව සිටින අතර නමුත් ඒ හා සමානම ලෙඩ රෝග වසංගත මහා පාරිසරික හානි අප ඇස් පනාපිටම දක්නට ලැබෙන්නේ තිබෙන සම්පත් සීමිත ප්‍රමාණය කළමණාකරණයෙන් යුතුව භුක්ති විදීමට තිබෙන නොහැකියාවයි. තරුණ ව්‍යවසායකයකු මිනිසුන් වැඩියෙන් පරිභෝජනය කරනු ලබන දෑ වෙනුවට පරිසරයට හිතකාමී නව සොයාගැනීම් සිදුකිරීම ඒවායින් ආර්ථික වාසි ලබාගැනීම ව්‍යවසායකයකු සතු භාර ධූර වගකීමක් ලෙස පෙන්වා දීමට පුළුවන. නිවාස ගොඩනැගිලි ඉදිකිරීමේදි කළුගල් දැව භාවිතය අවම කිරීම සඳහා යොදන නීති අන පනත් වෙනුවට එයට ආදේශකයක් හඳුන්වාදිමේ හැකියාව පැවරෙන්නේ කාටද යන්න ඔබ මදක් සිතා බැලිය යුතුය. ස්ථිර නිවාස වෙනුවට කළුගල් බිත්ති වෙනුවට පරිසරයට ඔරොත්තු දෙන මිනිසාට හානිදායක නොවන අමුද්‍රව්‍ය භාවිතා කර වාසස්ථාන ඉදිකර ගැනීමට සුදුසු මෙවලම් හැකි ඉක්මනින් සොයාගැනීමෙන් පරිසර විනාශය වලක්වා ලීම නැවතීම වගේම ඕසෝන් ස්ථරයේ සිදුරු ගණන් කිරීමද නවතාලිය හැකිය. දකුණු ආසියාවේ පුංචි රටක් වන භූතානයේ මුළු භූමි ප්‍රමාණයෙන් 80% ක් වන ඝනත්වයකින් යුතු රටකි. නමුත් ආර්ථික අතින් දුප්පත් රටකි. ලෝක බලවතුන් යැයි සැලකෙන රටවල් පරිසරය විනාශ කරමින් ආර්ථිකයේ හිනිපෙත්තටම නැග ධනිය සංවර්ධනය ගැන කතා කිරීම විහිළුවකි. ලෝක බලවත් රටවල් පරිසරය කෙතරම් විනාශ කර ලබන ආර්ථිකයට වඩා භූතාන පාලකයා මනසින් ලබන සතුට ඉතාම ඉහල බව ලෝකයා දැනගත යුතුය. පාලකයා ආදර්ශයට ගතහොත් එනම් ඔහුට තනියම සිදුකල නොහැකි ඉහත කාරණය සියළුදෙනා එක්ව සිදුකළ හොත් මතු පරපුරටද මෙම පොලෝ තලය තුළ ඔක්සිජන් සල්ලි වලට නොගෙන ජීවත් විය හැකිය. එවාගේම ව්‍යවසායකයන් විසින් වැඩි වශයෙන් නව ආර්ථික උපායමාර්ගනයන් සොයා ගැනීමේදි පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. මක්නිසාද යත් මිනිසුන් නැති ලෝකයක් බිහිවීම වලක්වාලිය හැක්කේ නූතන ආර්ථිකය පාලනය කරනු ලබන ලෝක බලවතුන්ට තම ආර්ථික මංපෙත් පෙන්වා දෙනු ලබන ව්‍යවසායකයන් පරිසර හිතකාමී ආර්ථිකය ඉහල නැංවිය යුතුයැයි සිතුවහොත් පමණි. එනම් ඔහුට තනිවම සිදුකළ නොහැකි ඉහත කාරණය සියළු දෙනා එක්ව සිදුකළහොත් මතු පරපුරටද මෙම පොළෝතලය තුළ ඔක්සිජන් සල්ලිවලට නොගෙන ජිවත් විය හැකිය. එ වගේම ව්‍යවසායකයන් විසින් වැඩි වැඩියෙන් තම ආර්ථික උපාය මාර්ගයන් සොයා ගැනීමේ දි පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීමත් ඉතා වැදගත් වේ. මක් නිසාද යත් මිනිසුන් නැති ලෝකයක් බිහිවීම වැළැක්විය හැක්කේ නූතන ආර්ථිකය පාලනය කරන ලෝක බලවතුන්ට තම ආර්ථික මංපෙත් පෙන්වා දෙනු ලබන ව්‍යවසායකයන් පරිසර හිතකාමීන්ට ආර්ථිකය ඉහල නැංවිය යුතුයැයි සිතුව හොත් පමණි.

මිනිසා විසින් සොයාගන්නා ලද නව තාක්‍ෂණික මෙවලම් නිසා මිනිසාට සිදුවූ එවන් ලෝක යුද්ධ ආශ්‍රයෙන් එනම් හිරෝෂිමා නාගසාකි වලට එල්ල වූ පරමාණු බෝම්බ වලින් ඇතිවූ ප්‍රතිවිපාක එම යුද්ධයට කිසිසේත අදාල නැති අද ඉපදෙන එම ප්‍රදේශයේ දරුවන්ටද වන්දි ගෙවන්නට සිදුව ඇත්තේ ආර්ථිකයත් ව්‍යවසායකයත් ධනිය සංවර්ධනය නැමති සමීකරණය හරියට විසඳා ගැනීමට නොහැකි වූ නිසාය. ලෝකයේ පහල වූ කිසිම ආගමික නායකයකු පරිසරය විනාශ කරපල්ලා මිනිසුන් මරපල්ලා මුදල් හම්බකරපල්ලා යැයි ප්‍රකාශ කර නැත. බුදුන් වහන්සේ පවා මල නොතලා රොන් ගන්නා ලෙස මිළ මුදල් එකතු කළ යුතු ආකාරය පිළිබඳව බුද්ධ දේශනා වල සඳහන් වේ. පරිසරයට කොතරම් බුදුරජාණන් වහන්සේ ආදරය කලේද යන්නට සාක්ෂි ලෙස මහා උදාහරණ අවශ්‍ය නැත. ඉපදීමත් ගසක් යට බුදුවීමත් ගසක් යට පරිනිර්වානයත් ගසක් යට එයට මහගු ආදර්ශයකි. අතිත පාලකයන් වනාන්තර නිර්මාණය කිරීම ඉතා වැදගත් කටයුත්තක් ලෙස සිදුකර තිබේ. නමුත් නූතනය වන විට ලංකාවේ වේවා වෙන්ත රටක වේවා ලෝක පරිසර දිනය සමරා සිටුවන ගස් ප්‍රමාණය හැදි වැඩි තිබුනානම් මුළු ලෝකයෙන්ම 90% ක් පමණ මහා වනාන්තරයන් බව නොවනුමානය. මා දකින ලෙසම පරිසරය ආරක්‍ෂා කරමින් නව ආර්ථික මෙවලමක් ලෙස සිල්බර කොටන් වෙනුවට කොන්ක්‍රිට් හඳුන් ආචාර්ය කුලසිංහයන් අපට සිටි දුර පෙනෙන හොඳ ව්‍යවසායකයෙකි. නූතන ව්‍යවසායකයන්ගේ වගකීම වන්නෙ සමාජ වටිනාකමකින් යුතු දෑ ඉතා හොඳින් සමාජ ගතකිරීමයි. ලෝකයට හඳුන්වා දුන් වල් නාශක හේතුවෙන් වල් පැල මර්ධනය කළද එය හඳුන්වා දුන් ව්‍යවසායකයා ඇලේ දොලේ පිරිසිදු වතුර ටික තිත්ත පැටව් ටිකට යන එන මං නැති කරන ලදි. එනම් ජලජ පරිසර පද්ධතියට වල් නාශක ආනිසංගයෙන් විනාශයට පත්විය. නමුත් එයට පිලියමක් ලෙස බෝතල් කළ පානිය ජලය ටවුමේ කඩෙන් මිළ දි ගත හැකිය. එ වගේම සල්ලි දි ටිකට් පතක් ලබාගෙන මින් මැදුරට ගොස් දන්ඩින් බුලත් හපයන් අපේ වක්කඩේ සිටි මාළු ටික දැක බලාගැනීමට අවස්ථාව සලසා දි තිබෙන්නේ ධනිය සංවර්ධනය තබේකට මායිම් නොකරන ව්‍යවසායකයන් යැයි කියා ගන්නා ටයි පැලදි මහත්වරුන්මය. නමුත් සිදුවිය යුත්තේ ඉහත කාරණයද යන්න ඔබ සිතා බලන්න. එමගින් සිදුවන ප්‍රතිවිපාක ලැබෙන්නේ එක් අයකුට නොව මුළු මහත් සමාජයටමය. එහෙත් මෙය වැලැක්වීමේ හැකියාවද පවතින්නේ අළුත් දේ දකින අළුත් දේ සොයන රට ඉදිරියට ගෙන යන රටට වටිනා ව්‍යවසායකයන්ට පමණි.

ව්‍යවසායකත්වපති
පශ්චාත් උපාධි අපේක්‍ෂක
තුෂාර පෙරේරා, සචින්ද පෙරේරා